සැ. යු.- 2011.10.07 දින පළ වූ අංක 1,727 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,728 - 2011 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2011.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1550 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1551 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1552 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1558 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

සැ. යු. - (i) මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ඔක්තෝබර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ඔක්තෝබර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - ගාල්ල**

රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය විසින් රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත උපලේඛනයෙහි සඳහන් මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

02. ටෙන්ඩර් පෝරම ගාස්තු පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ගෙවිය යුතු අතර, 2011.10.17 වැනි දින සිට 2011.11.04 වැනි දින ප.ව. 12.30 තෙක් මහාධිකරණය - ගාල්ල කාර්යාලයෙන් ලබා ගත හැක.

03. ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත් 2011.11.08 වැනි දින ප.ව. 2.30 ට පෙර "මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, ගාල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් පස උඩ කෙළවරේ "රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

05. එකී ටෙන්ඩර්පත් 2011.11.08 වැනි දින ප.ව. 3.00 ට මෙම අධිකරණයේ විවෘත කරනු ලබන අතර, එදිනට එකී වේලාවට ටෙන්ඩර් අයැදුම්කරුවන්ට හෝ බලය පවරනු ලබන නියෝජිතයෙකුට ඒ අවස්ථාවට සහභාගී විය හැකිය. ඉන්පසු ජයග්‍රාහී ටෙන්ඩර්කරු තේරීම ටෙන්ඩර් මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ.

06. වැඩිම මිල ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුට ගාල්ල - මහාධිකරණ ටෙන්ඩර් මණ්ඩලය විසින් නියම කරනු ලබන දිනට පෙර සියලුම මෝටර් වාහන මුදල් ගෙවා රැගෙන යා යුතුය.

07. ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* | *ආපසු නොගෙවන මුදල (පෝර්ම ගාස්තු)* | *ආපසු ගෙවන මුදල (ඇප තැන්පතුව)* |
|---|---|---|---|---|
| 01 | ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක 4471 | අංක SPLC 4814 ලොරි රථය (ඉසුසු) | රු. 100.00 | රු. 10,000.00 |
| 02 | ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක A. R. 2087 | අංක 204-3963 (බජාජ්) ත්‍රිවීල් රථය | රු. 100.00 | රු. 2,000.00 |
| 03 | ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක 87763 | අංක SPHC 8145 (බජාජ්) ත්‍රිවීල් රථය | රු. 100.00 | රු. 2,000.00 |
| 04 | ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක 97132 | අංක SPJH 6840 (බජාජ්) ත්‍රිවීල් රථය | රු. 100.00 | රු. 2,000.00 |
| 05 | ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක 27633 | අංක SPQB 9253 (බජාජ්) ත්‍රිවීල් රථය | රු. 100.00 | රු. 5,000.00 |

සරෝජිනී කුසලා වීරවර්ධන,
දකුණු පළාත්බද මහාධිකරණ විනිසුරු,
ගාල්ල.

2011 සැප්තැම්බර් මස 07 වැනි දින,
ගාල්ල මහාධිකරණයේ දී ය.

10-228

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මාතලේ**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් භාණ්ඩ 2011.12.03 වැනි දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳ වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියේ මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි මෙම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. වෙන්දේසි සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

උපුල් රාජකරුණා,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්

2011 සැප්තැම්බර් මස 20 වැනි දින,
මාතලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසිය සඳහා නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ඒ.ආර්. 490/8 | පාපැදි | 01 |
| 02. | ඒ. ආර්. 30/10 | පාපැදි | 01 |
| 03. | ඒ.ආර්. 318/09 | පාපැදි | 01 |
| 04. | ඒ.ආර්. 518/8 | පාපැදි | 01 |
| 05. | ඒ.ආර්. 527/11 | පාපැදි | 01 |
| 06. | ඒ.ආර්. 545/08 | පාපැදි | 01 |
| 07. | ඒ.ආර්. 640/08 | පාපැදි | 01 |
| 08. | ඒ.ආර්. 641/08 | පාපැදි | 01 |
| 09. | ඒ.ආර්. 761/09 | පාපැදි | 01 |
| 10. | ඒ.ආර්. 779/09 | පාපැදි | 01 |
| 11. | ඒ.ආර්. 826/10 | පාපැදි | 01 |
| 12. | අංක රහිත | පාපැදි | 50 |
| 13. | ඒ.ආර්. 50/07 | යතුරුපැදි | 01 |
| 14. | ඒ.ආර්. 106/09 | යතුරුපැදි | 01 |
| 15. | ඒ.ආර්. 546/08 | යතුරුපැදි | 01 |
| 16. | අංක රහිත | යතුරුපැදි | 05 |
| 17. | 88784 | අත් ට්‍රැක්ටර් | 01 |
| 18. | 94767 | අත් ට්‍රැක්ටර් | 01 |
| 19. | 95250 | අත් ට්‍රැක්ටර් | 01 |
| 20. | 98891 | අත් ට්‍රැක්ටර් | 01 |
| 21. | 88784 | කියත සමග ඉරුම් බැංකු | 01 |
| 22. | 94767 | කියත සමග ඉරුම් බැංකු | 01 |
| 23. | 95250 | කියත සමග ඉරුම් බැංකු | 01 |
| 24. | 98891 | කියත සමග ඉරුම් බැංකු | 01 |
| 25. | ඒ.ආර්. 02/09 | ජංගම දුරකථන | 01 |
| 26. | ඒ.ආර්. 286/10 | ජංගම දුරකථන | 01 |
| 27. | ඒ.ආර් 547/08 | ජංගම දුරකථන | 01 |
| 28. | ඒ.ආර්. 659/08 | ජංගම දුරකථන | 01 |
| 29. | ඒ.ආර්. 514/10 | ජංගම දුරකථන | 01 |
| 30. | බී 168/09 | ජංගම දුරකථන | 01 |
| 31. | ඒ.ආර්.566/09 | යකඩ රිම්ස් | 07 |
| 32. | ඒආර්.566/09 | ඩ්‍රම්ස්එක නොමැති ඩිපරන්ස් | 01 |
| 33. | ඒ.ආර්.566/09 | කොයිල්ස්ප්‍රින් | 02 |
| 34. | ඒ.ආර්.566/09 | හබ් බොක්ස් | 01 |
| 35. | ඒ.ආර්.566/09 | හබ් ජොයින්ස් | 02 |
| 36. | ඒ.ආර්.619/08 | බැරල් | 03 |
| 37. | ඒආර්.619/08 | පියන් එකක් සහිත යකඩ ගේට්ටු | 01 |
| 38. | ඒ.ආර්. 620/08 | අඩි 15 ක් දිග එල්අයරින් | 03 |
| 39. | ඒ.ආර්. 620/08 | අඩි 17 ක් දිග එල්අයරින් | 01 |
| 40. | ඒ.ආර්. 620/08 | අඩි 16 ක් දිග එල්අයරින් | 01 |
| 41. | 82454 | ඩිලුක්ස් වර්ගයේ යතුරුපුවරු | 01 |
| 42. | 82454 | මර්කරි වර්ගයේ මවුස් | 01 |
| 43. | 82454 | සැම්සුන් වර්ගයේ මොනිටර් | 01 |
| 44. | 82454 | මොෂිටා වර්ගයේ පී 3 පරිගණක | 01 |
| 45. | 98498 | කුරක්කන් කිලෝග්‍රෑම් 100 උර | 04 |
| 46. | 96532 | අලුහුණුපාර්සල් | 01 |
| 47. | 96540 | අලුහුණු පාර්සල් | 01 |
| 48. | 96541 | අලුහුණු පාර්සල් | 01 |
| 49. | 96544 | අලුහුණු පාර්සල් | 01 |
| 50. | 96550 | අලුහුණු පාර්සල් | 01 |
| 51. | 97551 | අලුහුණු පාර්සල් | 01 |
| 52. | අංක රහිත | බෝතල් | 750 |
| 53. | අංක රහිත | සවල් | 50 |
| 54. | අංක රහිත | කලගෙඩි | 15 |
| 55. | අංක රහිත | බැරල් | 20 |
| 56. | අංක රහිත | හුණුගල් කියුබ් | 01 |
| 57. | අංක රහිත | ප්ලාස්ටික් බූලි | 70 |
| 58. | අංක රහිත | පුලුන් උර | 03 |
| 59. | 97586 | හුණුගල් කියුබ් | 01 |
| 60. | 97929 | හුණුගල් කියුබ් | 01 |
| 61. | ඒආර් 570/11 | යූරියා පොහොර බෑග් | 01 |
| 62. | ඒආර් 570/11 | මැග්නීසියම් සෝල්ට් බෑග් | 01 |

10-232

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරමි:-

සමාගමේ නම : බෝමුරුඇල්ල පවර් බේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 81347
සංස්ථාගත කිරීමේ දිනය : 2011 සැප්තැම්බර් 19
සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : එපාර්ට්මන්ට් 5508 - 2000 ප්ලාසා අංක 25, නව රෝහල පාර, ශ්‍රී ජයවර්ධනපුර, නුගේගොඩ.

අධ්‍යක්ෂ.

10-285

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

වැලිගම, හෙට්ටිවීදිය, අංක 149ඒ හි පදිංචි නාමිනි ආරච්චිගේ රොෂාන් ධම්මික ගුණවර්ධන වන මා විසින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් පියසිරි ජයරත්න මහතා ලියා සහතික කළ අංක 771 සහ 2009.09.13 දිනැති ඇටෝනි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු වශයෙන් වැලිගම, හෙට්ටිවීදිය අංක 149 ඒ හි පදිංචි කොස්වත්ත ගමගේ ධම්මිකා ප්‍රියන්ති යන අය පත් කරන ලදී. අද දින, 2011.09.15, පටන් එම ඇටර්නි බලපත්‍රය අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාම වෙත මින් දැනුම් දෙනු ලැබේ.

නාමිනි ආරච්චිගේ රොෂාන් ගුණවර්ධන,
(ඇටර්නි අධිපති).

10-294

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 11(5) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අපි මෙයින් නිවේදනය කර සිටිමු :-

සමාගමේ කලින් නම : සොෆ්ට්ලොජික් කැපිටල් ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 779
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 1, ලේක් ක්‍රෙසන්ට්, කොළඹ 02
සමාගමේ අලුත් නම : සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී.

සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී. ඩබ්. කෝපරේට් සෙක්‍රටේරියල්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

10-297

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1. සමාගමේ නම : ඒම් ගැෆික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 78231
3. සංස්ථාගත කළ දිනය : 2011.04.06
4. සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 185, මාදින්නාගොඩ පාර, රාජගිරිය.

සමාගමේ ලේකම්.

10-315

---

## සමාගමක් සංස්ථාපිත කළ බව ප්‍රසිද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බිස්සිකියෝස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : පී වී 81016
ලියාපදිංචි කාර්යාලය : අංක 19/3, ස්වර්ණ පාර, කොළඹ 06.

10-317

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

බත්තරමුල්ල, තලංගම දකුණ, දේසිංහ මාවත, අංක 626/බී/2 පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක 602003434වී දරන ස්වර්ණහංස කර්මාන්ත මුහම්දිරම්ලාගේ අශෝක නිමල් වන මම, බත්තරමුල්ල, පැලවත්ත, සිංහ පුර, අංක 62 හි පදිංචි ආනන්ද ගුණතිලක යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරමින් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. කෞෂලි මිය. සහතික කළ අංක 1553 සහ 2010.08.18 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව මින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. තවද එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වගනොකියන බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

ස්වර්ණහංස කර්මාන්ත මුහම්දිරම්ලාගේ අශෝක නිමල්.

10-318

---

## නිවේදනය

ජෝන්ස් ලැන්ග්ලසෙල් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් 2011 සැප්තැම්බර් 12 දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ජෝන්ස් ලැන්ග්ලසෙල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 81191
ලියාපදිංචි කාර්යාලය : 216, ද සේරම් පෙදෙස, කොළඹ 10.

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
ජෝන්ස් ලැන්ග්ල්සෙල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

10-310

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වෙනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1. සමාගමේ නම : නිත්වේ ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 80857
3. සංස්ථාගත කළ දිනය : 2011.08.24
4. සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 42, කැමරන් පෙදෙස, කොළඹ 03.

සමාගමේ ලේකම්.

10-314

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වෙනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1. සමාගමේ නම : මාර්ස් ටෙක්ස් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 78232
3. සංස්ථාගත කළ දිනය : 2011.04.06
4. සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 185, මාදින්නාගොඩ පාර, රාජගිරිය.

සමාගමේ ලේකම්.

10-313

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ් සිය නාමය 2011 සැප්තැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කැපිටල් අලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් වශයෙන් වෙනස් කොට ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ. ඉහත කී පනතේ 8 වැනි වගන්තියෙහි විධිවිධාන අනුව මෙම වෙනස් කිරීම සිදුකර ඇත.

සමාගමේ නව නම : කැපිටල් අලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : PB 765
ලියාපදිංචි කාර්යාලය : අංක 21, කුමාර වීදිය, නුවර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
කැපිටල් අලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්.

10-309

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2011 සැප්තැම්බර් මස 22 දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ෆියුචර් ලින්ක්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජිකල් ස්ටඩීස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී.වී. 81458
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 122, ආර්නෝල්ඩ් රත්නායක මාවත, කොළඹ 10.

අධ්‍යක්ෂ මංඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ්
සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

10-311

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වෙනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1. සමාගමේ නම : පී. එන්. පී. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 81074
3. සංස්ථාගත කළ දිනය : 2011.09.05
4. සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක බී -3, වදුලු සෙවන, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.

සමාගමේ ලේකම්.

10-312

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කුරුණෑගල, හිඳගොල්ල, මීගොල්ල, ගල්ගොඩේවත්ත පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ අජිත් සුදර්ශන තෙන්නකෝන් වන මා විසින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් දිලානි ලංකා වේරගොඩ සහතික කරන ලද අංක 113 සහ 2004 ජූලි මස 21 දින දරන කුරුණෑගල රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ 6/115 පත් ඉරුවේ දිනපොත් අංක 502 යටතේ 2004.07.22 වැනි දින ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය මත හිඳගොල්ල, මීගොල්ල, ගල්ගොඩේ වත්ත පදිංචි කාරියවසම් හේවාමානගේ චම්පිකා රෝහිණී වෙත පවරන ලද බලතල මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී කාරියවසම් හේවාමානගේ චම්පිකා රෝහිණී විසින් මා වෙනුවෙන් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා විසින් වග කියනු නොලැබේ.

ටී. එම්. අජිත් සුදර්ශන තෙන්නකෝන්.

2011 සැප්තැම්බර් මස 19 වැනි දින.

10-211

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සුවනි හෙල්ත් කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 ක් වූ අගෝස්තු මස 03 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සුවනි හෙල්ත් කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී. 80434
ලියාපදිංචි ලිපිනය : උඩුගම පාර, බටදූව, ගාල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පතිරණගේ සමන්ති ඉන්දිකා රණතුන්ග,
ලේකම්.

දුරකථන අංක : 071-8244495/077-8197041.

10-249/1

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව වී කේ මෙටල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : වී කේ මෙටල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 81274
ලියාපදිංචි ලිපිනය : "ඉසුර", රුහුණු රිදියගම, අම්බලන්තොට.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී ඒ කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක : 071-8244495/077-8197041.

10-249/2

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව නිව් තිසර චයිනීස් රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : නිව් තිසර චයිනීස් රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 81369
ලියාපදිංචි ලිපිනය : 22, පරණ පාර, පන්නිපිටිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී ඒ කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක : 0718244495/077 8 197041.

10-249/3

---

### සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඇලුග්‍රෝ ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ්
සංස්ථාපිත අංකය : PV 81141
ලියාපදිංචි කළ දිනය : 2011 සැප්තැම්බර් 08
ලියාපදිංචි ලිපිනය : 117, හොරණ පාර, පානදුර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-295

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගම් නාමය : හයිටෙක් ෆයර් ඇන්ඩ් රෙස්කියු සිස්ටම්ස් (පුද්ගලික) සමාගම
සමාගම් ලියාපදිංචි අංකය : පී. වී. 75778
ලියාපදිංචි දිනය : 2010 දෙසැම්බර් 01
ලිපිනය : අංක 15/17ඒ, වටරවුම් පාර, බදුලුපිටිය, බදුල්ල.

ආර්. එම්. එම්. සී. රත්නායක,
සමාගම් ලේකම්.

10-213

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගමේ නාමය වෙනස් වූ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ :-

සමාගමේ නාමය : අයි. එච්. එස්. ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 80373
ලියාපදිංචි ලිපිනය : රොක් හවුස් ගොඩනැගිල්ල, රොක් හවුස් කැම්ප්, මෝදර, කොළඹ 15
ලියාපදිංචි කළ දිනය : 2011.08.01

සී. ඒ. එස්. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලේකම්.

10-283/1

## දැන්වීමයි

පහත සඳහන් සමාගමේ නාමය වෙනස් වූ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ :-

සමාගමේ නාමය : එස්. ආර්. එම්. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 80790
ලියාපදිංචි ලිපිනය : 75/3, බාන්ස් ප්ලේස්, කොළඹ 07
ලියාපදිංචි කළ දිනය : 2011.08.22

සී. ඒ. එස්. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

10-283/2

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :-

සමාගමේ නම : සරසි ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 81241
සංස්ථාගත කළ දිනය : 2011 සැප්තැම්බර් 16
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 233/1, නුවර පාර, කලල්පිටිය, පස්යාල.

අධ්‍යක්ෂ.

10-284

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9(1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : කාල්ටන් ප්‍රී ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 80782
ලියාපදිංචි දිනය : 2011.08.22
ලියාපදිංචි ලිපිනය : අංක 96, කාල්ටන් නිවස, මාතර පාර, තංගල්ල.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

අංක 27/1, පැපිලියාන පාර,
නැදිමාල,
දෙහිවල.

10-227

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වත්තල, හැඳල පාර, අංක 259/5ඒ සහ දැනට මොරටුව, උයන පාර, අංක 41/4 හි පදිංචි ජයසූරිය ආරච්චිගේ ඉන්දිකා නිර්මලා ශයනිකා රොද්‍රිගු විවාහයට පෙර ද සේරම් (ජා.හැ.අ. 746252269v) වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාවට යථා පරිදි දන්වා සිටින වග නම්, වත්තල, ශාන්ත අන්තෝනි පෙදෙස, හැඳල පාර, අංක 259/5 හි පදිංචි යසෝමා නන්දනී රොද්‍රිගු (ජා. හැ. අ. 447682133v) යන අයට මා විසින් ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. තලගල විසින් වර්ෂ 2008 ක් වූ ජූලි මස 22 වැනි දින ලියා සහතික කරන ලද අංක 554 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කොට බලරහිත කරන ලද බවත්, මින් ඉදිරියට එකී අංක 554 දරන ඇටර්නි බලපත්‍රය භාවිතා කරමින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මාගේ වගකීමක් නොමැති බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජයසූරිය ආරච්චිගේ ඉන්දිකා
නිර්මලා ශයනිකා රොද්‍රිගු.

වර්ෂ 2011 ක් වූ සැප්තැම්බර් මස 21 වැනි දින දී ය.

10-212

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාපනය කරන ලද පහත සමාගම පිළිබඳව තොරතුරු එම පනතේ වගන්ති අංක 9 උපවගන්ති 1 නියමයන්ට අනුකූලව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ:-

සමාගමේ නම : ඉන්ක්ලූසිව් වෙබ් මැනේජ්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය හා දිනය : පීවී 80904, 2011 අගෝස්තු මස 25 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 43/3, රෝස්මීඩ් ප්ලේස්, කොළඹ 07.

සමාගමේ ලේකම්.

10-247

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාපනය කරන ලද පහත සමාගම පිළිබඳව තොරතුරු එම පනතේ වගන්ති අංක 9 උපවගන්ති 1 නියමයන්ට අනුකූලව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ :-

සමාගමේ නම : මිනිට් කෑෂ් ෆිනෑන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය හා දිනය : පීවී 80884, 2011 සැප්තැම්බර් මස 06 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 474/5, මීගමු පාර, අලුත් මල්කඩුවාව, කුරුණෑගල.

සමාගම් ලේකම්.

10-248

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාපනය කරන ලද පහත සමාගම පිළිබඳව තොරතුරු එම පනතේ වගන්ති අංක 9 උපවගන්ති 1 නියමයන්ට අනුකූලව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඉන්ක්ලුසිව් මීඩියා මොනිටරින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය හා දිනය : පීවී 80903, 2011 අගෝස්තු මස 25 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 43/3, රෝස්මඩ් ප්ලේස්, කොළඹ 07.

සමාගමේ ලේකම්.

10-246

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. දේවසේනාපති ලියා සහතික කරන ලද 1962 දෙසැම්බර් මස 11 වැනි දිනැති අංක 833 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි අධිපතීන්ගේ කෙනෙකු වන නුරුල් අමීනා මාකන් මාකර්ගේ උරුමක්කාරයෙකු වන මොහොමඩ් මොහිඩීන් සම්සදීන් මාකන් මාකර් වන මම ඉහත කී ඇටෝර්නි අධිපති විසින් පිළිවෙලින් මොහොමඩ් ඕමාර් උස්මාන් සහ දේවසේනාධිපති වික්‍රාන්ත යන සාක්ෂිකරුවන් ඉදිරිපිට දී ලියා සහතික කල එකී අංක 833 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් ඇටෝර්නි බලකරු ලෙසට පත් කර ඇති ඕ. එල්. එම්. මාකන් මාකර් පුද්ගලික සමාගමට මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළ සම්බන්ධයෙන් මට ඇති අයිතිවාසිකම්, උරුමකම් සහ බලපුළුවන්කාරකම් සම්බන්ධව ලබා දී ඇති විශේෂ ඇටෝර්නි බලය මෙහි දින සිට අවලංගු වී අහෝසි වී බලරහිත වන අතර බල පැවැත්මක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, අනෙකුත් සියලු දෙනාටත් දන්වා සිටිමි.

තව ද, එකී අංක 833 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එකී ඇටෝර්නි බලකරුට අනෙකුත් ඉඩම් පරිශ්‍රයන් සම්බන්ධව ලබාදී ඇති ඇටෝර්නි බලය තවදුරටත් බලපැවැත්වේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුල කොටුවෙහි පිහිටි ඉඩමට එන් වොලන් හෝවන් බලයලත් මානක තැනගේ 1994 මැයි 30 දිනැති අංක 557 පිඹුරෙහි වරිපනම් අංක 24, යෝක් වීදිය, අංක 33 සහ 37, 33 1/3, සහ 33 1/4 කුමාර වීදිය (කලින් අංක 33 සහ 37 කුමාර වීදිය) නමැති ඉඩමට මායිම් : උතුරු නැගෙනහිරට: පදික වේදිකාව, දකුණු නැගෙනහිරට : යෝක් වීදියේ පදික වේදිකාව දකුණු බටහිරට : කුමාර වීදියේ පදික වේදිකාව සහ උතුරු බස්නාහිරට : වයිට් - අවේ ලේඩ්ලෝ සම සමාගමට අයිති පදික වේදිකාව (දැනට රජයට අයත්) යන මායිම් තුල පිහිටි වපසරිය රූඩ් එකයි පර්චස් දහ හතක් සහ සියයෙන් දහ අටෙන් පංගුව (අ. 0, රූ. 1, පර්. 17 18/100) (පිඹුරේ විස්තර කර ඇති ආර්කේඩ්ස් ද ඇතුළුව) කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ290/290 හි ලියාපදිංචි කර ඇත.

10-243

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ඉන්ෆ්ලෝ ලක්යාය (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පීවී : 81261
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 228/6, ඉඳෝලමුල්ල, දොම්පේ.
සමාගම ලියාපදිංචි කළ දිනය : 2011.09.14

10-235/1

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ග්‍රීන් ගාර්ඩ්න් හොලිඩේ රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පීවී : 81358
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : ග්‍රීන් ගාර්ඩ්න් හොලිඩේ රිසෝට් (ප්‍රයිවට්)ලිමිටඩ්, නුවර පාර, කපුවත්ත, දඹුල්ල.
සමාගම ලියාපදිංචි කළ දිනය : 2011.09.19

10-235/2

---

## ඇටෝර්නි බලකරය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගම්පහ දිස්ත්‍රික්කයේ මාකොළ තලවතුහේන්පිට දකුණ, ආසිරි උයන අංක 222/1 හි පදිංචි, හේමතිලක බණ්ඩාර මංගල ඉලංගසිංහ වන මා, මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු ලෙස මාතලේ, අගලවත්ත පාර, අංක 05 හි පදිංචි, කොට්ටගොල්ලේ ගෙදර සුනිල් ජයසේකර පත් කරමින් සකසන ලද ප්‍රසිද්ධ නොතාරිස් ගාමිණී ඉලංගසිංහ විසින් සහතික කරන ලද අංක 104 සහ වර්ෂ 2010 ක් වූ ජුනි මස 17 දිනැති මහනුවර රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම කලාපයේ ලිඛිත බලධාරි සහ ඇටෝර්නි බලපත්‍ර පොතේ 50 වැනි කාණ්ඩයේ 81 වැනි පත් ඉරුවේ 1302 දින පොතේ වර්ෂ 2010.06.22 දිනැතිව ලියාපදිංචිව ඇති ඇටෝර්නි බලකරය මෙවක් පටන් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවට උතුම් වූ ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

හේමතිලක බණ්ඩාර මංගල ඉලංගසිංහ,
ඇටෝර්නි අධිපති.

2011 සැප්තැම්බර් මස 11 වැනි දින.

10-344

## ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

පානදුර ගඟුල තන්තිරිමුල්ල අංක 58 දරන ස්ථානයේ පදිංචි මද්දුමාගේ අනුර තිලක් ගාමිණී වන මා විසින් ලියනපතිරණ ආරච්චිගේ කල්‍යාණී මංජරී යන අයට 2003.07.19 වැනි දින සුදත් ඩී දල්පතාදු ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද අංක 2351 දරන ඇටෝර්නි බලය 2011.09.07 දින සිට බල රහිත වන බව දන්වා සිටී.

නීතිඥ උපුල් කුමාර මුණසිංහ.

10-343

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මොරටුව, කල්දෙමුල්ල, සී. ජී. ද සිල්වා මාවත, අංක 40 හි පදිංචි ප්‍රදීපා නිල්මිණී ද සිල්වා වන මා විසින් රත්මලාන, ශ්‍රී සුමංගල මාවත, ඕෂන් බීරිෂ් නිවාස සංකීර්ණය, අංක 46/10 4/බී හි පදිංචි ඉනත්අප්පුලි මුහන්දිරම්ගේ සිරිනි ද සිල්වා වෙත ප්‍රදානය කරන ලද උදිත මුහන්දිරම්, ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2011 ක් වූ පෙබරවාරි මස 03 වැනි දින සහතික කරන ලද අංක 976 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රදීපා නිල්මිණී ද සිල්වා.

2011 අගෝස්තු මස 18 වැනි දින දී ය.

10-337

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බණ්ඩාරගම, වල්ගම පදිංචි, රංජිත් ප්‍රේමචන්ද්‍ර හෙට්ටිආරච්චි සහ නාවුල්ලගේ වජිරා නිලන්ති පෙරේරා වන අප, මොරටුව ලක්ෂපතිය, ද මැල් මාවතේ අංක 30/3 එච් හි පදිංචි, සුසන් වැලරි ඩිනිස් අපගේ ඇටෝර්නි බලකාරිය ලෙස පත්කරමින් කේ. ඇම්. කරුණාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කළ අංක 247 සහ වර්ෂ 2004.04.30 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමු.

තව ද, එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට ඇය විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට අප වග නොකියන බව වැඩිදුරටත් ප්‍රකාශ කරමු.

රංජිත් ප්‍රේමචන්ද්‍ර හෙට්ටිආරච්චි,
නාවුල්ලගේ වජිරා නිලන්ති පෙරේරා.

වර්ෂ 2011 ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින දී ය.

10-367

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දඹදෙණිය වඩුවාකෙටු ගල්වත්ත, ගල්වත්ත පදිංචි බටවල ආචාරිගේ අජිත් වන මම, මා විසින් එම ලිපිනයේ ම පදිංචි පුෂ්පා රංජනී යන අය වෙත බලය පවරන ලද්දා වූ, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ධර්මවිජය සෙනෙවිරත්න මහතා විසින් කෙටුම්පත් කරන ලද රියාද් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිලධාරී විසින් සහතික කරන ලද අංක රහිත 2010.02.16 දිනැති විදේශීය ඇටෝර්නි බලපත්‍රය මගින් පවරන ලද බලය මෙයින් අවලංගු කරනු ලැබේ. එම ඇටෝර්නි බලපත්‍රය මත මින් ඉදිරියට කරනු ලබන කිසිම ක්‍රියාවකට මා විසින් වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

බටවල ආචාරිගේ අජිත්.

2011 සැප්තැම්බර් මස 29 වැනි දින.

10-354

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) ජේදය යටතේ පහත සඳහන් ලැන්ඩ් ලෝර්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලැන්ඩ් ලෝර්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2011.09.15
සමාගමේ අංකය : පී. වී. 81292
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 86, කිරුලපන මාවත, කොළඹ 05.

සේනානි කරුණානායක,
සමාගමේ ලේකම්.

අංක 86, කිරුලපන මාවත,
කොළඹ 05.

10-372

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පන්නිපිටිය නියඳගල ආසිරි මාවත අංක 62/7 හි පදිංචි නිමල් වසන්තා පියදාස වන මා විසින් මා නමින් කටයුතු කිරීමට පන්නිපිටිය නියඳගල ආසිරි මාවත අංක 62/7 හි පදිංචි ඉන්ද්‍රසිරි පිනිදිය වික්‍රමගුණරත්න යන අය වෙත ප්‍රසිද්ධ නොතාරිස් රංජිත් ආරච්චිගේ ලියා සහතික කළ අංක 201 සහ 2011.02.08 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව සියල්ලන් වෙත දන්වා සිටිමි.

නීතිඥ ඩබ්ලිව්. ඩී. ගමගේ,
ඇටෝර්නි අධිපති වෙනුවට.

10-371

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - කරන්දෙනිය ශාඛාව**
(කලින් රුහුණ සංවර්ධන බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2011.11.15 දින පෙ.ව. 11.30 ට එම දේපල ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනණු ලැබේ.

**දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තර වල්ලාවිට කෝරළයේ (මධ්‍යම) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 87ඩී වතුගෙදර ග්‍රාම නිලධාරි වසමේ සීනිගොඩ නමැති ගමේ පිහිටි, සර්වේ ජනරාල් විසින් සාදන ලැබූ ඔහු භාරයේ ඇති, මුපිගා 1749 දරන පිඹුරෙහි අංක : 66 දරන සීනිගොඩවත්ත නමැති රජයේ ඉඩම් කැබැල්ල වූ රූඩ් එකක් (අ. 0, රූඩ්. 01, පර්. 0) ක් විශාල ඉඩම සහ ඊට අයත් සියළු දේද වේ.

වැඩි විස්තර සඳහා 2009.12.24 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2010.05.21 දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*- අම්බලන්ගොඩ සිට ඇල්පිටිය දෙසට කි. මී. 2 1/2 ක් පමණ ගිය විට වතු ගෙදර හන්දිය හමුවේ. එතැන් සිට මී. 500 ක් පමණ ගිය විට සීනිගොඩ පාර හමුවේ. එම පාරේ මීටර් 700 ක් පමණ ගොස් දකුණු පසට වැටී ඇති අතුරු පාරේ මී. 50 ක් පමණ ගිය විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1 % ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2 % ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382ඒ, දරන ස්ථානයේ පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ, දකුණු පළාත් කාර්යාලයේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 09-2290135

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර,
දුරකථන අංක : 041-2228731/071-4438516.

10-233

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මොරටුමුල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු වටිනා දේපළක් .- බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාවේ, රාවතාවත්තේ පිහිටි තුන්වැනි පටුමග වරිපනම් අංක 19 සහ 1/9 දරන ගනේ වත්ත නමැති ඉඩමට බලයලත් මානක සුනිල් ජේ පීරිස් විසින් මැන සාදන ලද අංක 5137 සහ 2000.10.03 දින දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 හි ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම අටයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 14.80) විශාල ඉඩම, ගොඩනැගිලි සහ ඊට අයත් සියලුම දේ ද වේ.

මෙම දේපළ .- මහමෙදිගේ කමල්සිරි මෙන්ඩිස් ණය කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2000.12.06 දින අංක 4609 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - මෙම දේපළට ළඟාවීමට හැකිවන්නේ මොරටුව රාවතාවත්ත හන්දියේ සිට වම් පැත්තේ ඇති ජනතා ජය මාවතේ සැතපුම් කාලයක් (1/4)ක් පමණ දුර යාමෙන් පසුවය. මෙම මාවත දිගේ තවත් යාර 500ක් පමණ දුරක් ගිය විට මෙම දේපළ වම් අත පැත්තේ වරිපනම් අංක 19 ජනතා ජය මාවත නමැති ස්ථානයේ පාරට මායිම්ව පිහිටා ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ වර්ෂ 2011ක් වූ නොවැම්බර් මස 02 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* වර්ෂ 2011.11.14 වැනි දින ද, ලක්බිම සහ ඩේලිමිරර් පුවත්පත් වල 2011.03.28 ද, දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිළෙන් 10% (සියයට දහයක්) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකක්) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500ක් සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු හා විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000ක් ද,

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ (සියයට අනූවක්) මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු වේ. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු, (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2661821, 011-2661835.
කර්යාලය : 011- 5756356, 011- 2334808 071-8760986.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු සහ,
තක්සේරුකරු, සාම විනිසුරු.
(මුළු දිවයිනටම)

10-368

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ජේ. ආර්. එම්. එන්. කේ. අමරසිංහ සහ එස්. එච්. ගොඩගම
ගිණුම් අංක : 1064 5320 3363

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010ක් වූ ජනවාරි මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එකොලොස් ලක්ෂ හැට දහස් පන්සිය පනස් තුනයි ශත හැට අටක (රු. 11,60,553.68) මුදල ද 2009 දෙසැම්බර් මස 12 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය ලක්ෂ අසූ අට දහස් හයසිය අනූ හතරයි ශත තිස් හතක (රු. 6,88,694.37) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) හා තවත් රුපියල් දෙලක්ෂ අනූ දෙදහස් හයසිය අනූ හතරයි ශත හැට හයක (රු. 2,92,694.66) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.03.12 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2010.03.12 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.10.31 දින ප. ව. 3.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ ගන්දොළහ පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කහගොල්ල ග්‍රාමයේ පිහිටි "බදුගේවත්ත සහ දෙල්ගහමුලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. සී. පී. ගුණසේන යන අය විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 05 දාතම හා අංක 2522 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : අංක 1762 දරන පිඹුරේ ලොට් 1 නැගෙනහිරට : අංක 1762 දරන පිඹුරේ ලොට් 1 දකුණට : උඩහවත්ත සහ ඉඹුල්පරේවත්ත සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් තුනයි දශම හයක් (අ. 0 රූ. 1 පර්. 33.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2522 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 1213/90 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහත සඳහන් ඉඩමේ නැවත මිනුමකි :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ ගන්දොළහ පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කහගොල්ල ග්‍රාමයේ පිහිටි "බදුගේවත්ත සහ දෙල්ගහමුලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ලියනගේ යන අය විසින් සාදන ලද 1966 අගෝස්තු 31 දාතම හා අංක 1762 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 1 නැගෙනහිරට : උඩහවත්ත දකුණට : ඉඹුල්පරේවත්ත සහ බස්නාහිරට : මහ අරඹ සහ අඩි පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම එකයි දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 36.125) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1762 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඊ 641/202 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-361

## හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - හෙට්ටිවීදිය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හැඳින්වුණ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දකුණු අලුත්කුරු කෝරළේ අදිකාරි පත්තුවේ වත්තල, මාබෝල නගර සභා සීමාව තුළ නාගරික කොට්ඨාශ අංක 4 තෙළගපාත පිහිටි තෙළගපාත මාවතේ, වරිපනම් අංක 103/13 ඕ දරන බලයලත් මිනින්දෝරු එච්. ඩොනල්ඩ් විසින් මැන සාදන ලද 1989.01.28 දාතම හා අංක 364 දරන පිඹුරේ ලොට් 2 ඒ ලෙස නිරූපිත, ප්‍රමාණයෙන් පර්චස් 12 (අක්. 0 රූ. 0 පර්. 12.00) ක් වන "ගොරකගහකුඹුර" නමැති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි සහ සෑම සියළු දේ සමගය.

*ප්‍රවේශ මාර්ගය* .- වත්තල, කොළඹ - මීගමුව පාර තෙළගපාත පාර හන්දියෙන් හැරී තෙළගපාත පාරේ මීටර් 850ක් පමණ දුර ගොස් වම් පස පිහිටි අඩි 12 ක ගුරුපාරේ මීටර් 200ක් පමණ ගිය විට දකුණුපස පිහිටි මෙම දේපළ හමු වේ.

මුතුකුට්ටි කුබේරරිංගම් යන අය වෙත සපයන ලද ණය පහසුකම් වෙනුවෙන් ඔහු විසින් බැඳුම්කරු වශයෙන් හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙත උකස් තබන ලද ඉහත විස්තර කර ඇති දේපළ 2011 නොවැම්බර් මස 01 වැනිදා අඟහරුවාදා පෙ. ව. 11.30 ට ආරම්භව අප විසින් දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.10.14 වැනිදා *රජයේ ගැසට් පත්‍රය* බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගාස්තු මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) දේශීය අලෙවි බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තුව.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජය හෝ වෙනත් අදිකාරියක් මගින් පනවන ලද හා අදාළ වන අවස්ථාවක ව්‍යවස්ථානුකූල අයබදු, තීරුබදු, බදු හෝ ගාස්තු සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු හා අදාල ලිපි ලේඛණ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479, හැටන් නැෂනල් බැංකුව පීඑල්සී හා සහකාර සාමාන්‍යාධිකාරි- නැවත අයකර ගැනීම් වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන අංක 011- 2661816 ෆැක්ස් අංකය : 2661835.

ඩලස් කෙලාට් ඔක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
විශේෂඥ වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ නියෝජිත.

අංක 146/3, කල්දේරා ගාර්ඩන්ස්, දුටුගැමුණු විදිය,
කොහුවල.
දුරකථන අංක : 4302622, 4302623.
ෆැක්ස් අංකය : 2856013.

10-359

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2007.02.23 දින සහ අංක 2698 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජපක්ෂ මුදියන්සේලාගේ අබේපාල යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී 2011 නොවැම්බර් මස 04 වැනි දින පෙ.ව. 10.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ (නමුත් මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුල) අළුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුල යටියන ගමෙහි පීල්ලවත්ත තුල කටුනායක මිනුවන්ගොඩ ප්‍රධාන මාර්ගයේ පීල්ලවත්ත එස්ටේට් අංක 3 හෙවත් ආඩිඅම්බලම එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් මැන සාදන ලද 2005.12.21 දිනැති අංක 2359 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 163 ලෙස ලකුණු කර ඇති පර්චස්. 12.60 විශාල ඉඩම (අ.0, රූ. 0, පර්. 12.60) (එකී අංක 2698 දරන උකස් බැඳුම්කරයේ උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතියද සමග වේ.)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.04.15 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.05.02 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම*.- මිනුවන්ගොඩ සිට මීගමුව පාරේ කි. මී. 3.3ක් ගිය විට දකුණට හැරුණු පසු පීල්ලවත්ත බිග් සිටි නිවාස සංකීර්ණය හමුවේ. එම පාරේ මීටර් 400 ක් පමණ ගියවිට අංක 163 දරන ඉඩම එම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුයි. දින 30 ක් තුළ දී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 99, උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංකය : 011-3144520,
දුරකථන/ෆැක්ස් : 011-244539
ඊමේල් : Senaservice @ sltnet.lk

ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අය කිරීම්),
හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී,
අංක 479, ටී. බී. ජයා මාවත,
කොළඹ 10,
දුරකථන අංකය : 011-2664664.

10-340

---

## බලපිටිය දිසා අධිකරණයේ දී ය

### නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

පෙරුමාබඩුගේ රංජිත් ලාල් ප්‍රනාන්දු,
අංක 31, මංගල පාර, බේරුවල

නඩු අංකය :
විශේෂ /1939 ..........................පෙත්සම්කරු.

*එදිරිව*

1. ඉලිය කුට්ටිගේ ජිනදාස ප්‍රනාන්දු,
අංක 339, පොල්වත්ත, වරාහේන,
බෙන්තොට

............................වග උත්තරකරු.

ඉහත සඳහන් නඩුවේ නියෝගයන් අනුව මා වෙත නිකුත් කර ඇති කොමිෂන් බලපත්‍රයේ බලය පිට මෙහි උපලේඛනයෙහි මනා ලෙස විස්තර කර ඇති දේපළ වර්ෂ 2011 ක් වූ නොවැම්බර් මස 18 වැනි දින පෙරවරු 10.30 ට බෙන්තර වලල්ලාවිටි කෝරළේ, අතුරුවැල්ලේ පිහිටි, "පොල්වත්ත නමැති ඉඩමේ අංක 14 දරන කැබැල්ල නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද අංක 14 ඒ අක්ෂරය දරන ඉඩම් කැබැල්ල" නම් වූ ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තු රු. 2,000ක්,
5. වෙන්දේසිය සඳහා වැය වන සියලුම ප්‍රචාරක වියදම්,
6. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී බලපිටිය දිසා අධිකරණයේ මෙම නඩුවේ ගිණුමට බැර වනසේ අම්බලන්ගොඩ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කළ යුතු ය.

විකිණීමට යෝජිත ඉඩමේ ඔප්පු පිරික්සීම සහ අවශ්‍ය වැඩි විස්තර බලපිටිය දිසා අධිකරණයේ නීතිඥ සුජීව හිරන්ති සිල්වා මහත්මියගෙන් හෝ වෙන්දේසිකාර මාගෙන් දැන ගත හැකි වේ.

### උපලේඛනය

මෙම නඩුවට ගොනුකොට ඇති බලයලත් මිනින්දෝරු වික්ටර් ගොඩහේන මහතා විසින් මැන බෙදා වෙන් කරන ලද 2009.11.28 දින හා අංක 1809 දරන පිඹුරේ නිරූපිත -

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිටි කෝරළේ අතුරුවැල්ලේ පිහිටි බලපිටිය දිසා අධිකරණයේ නඩු අංක බී. 1229 දරන නඩුවේ ගොනුකර ඇති අංක 2039 දරන පිඹුරේ නිරූපිත " පොල්වත්ත නමැති ඉඩමේ කැබලි අංක 14 දරන කැබැල්ල" නම් වූ උතුරට : එම ඉඩමේ අංක 15 දරන කැබැල්ල ද, නැගෙනහිරට : දුම්රිය මාර්ගය ද, දකුණට : පාර ද, බස්නාහිරට : කොළඹ සිට ගාල්ල දක්වා මහා මාර්ගය ද, මායිම් වූ රූඩ් එකයි, පර්චස් එකයි දශම හතයි පහක් (අක්. 0 රූ. 1 පර්. 01.75) විශාලත්වය ඇති ඉඩමෙන් නැවත බෙදා වෙන් කරන ලද අංක 14 ඒ දරන කැබැල්ල නම් වූ උතුරට : එකී අංක 1809 දරන පිඹුරේ සඳහන් අංක 14 බී දරන කැබැල්ල ද, නැගෙහිරට : දුම්රිය මාර්ගය ද, දකුණට : පාර ද, බස්නාහිරට : කොළඹ සිට ගාල්ල දක්වා මහා මාර්ගය ද, යන මායිම් තුළ පර්චස් විස්සක් (අක්. 0 රූ. 0 පර්. 20) විශාලත්වය ඇති ඉඩම සහ එහි තුළ තිබෙන සියලු දේත් වේ.

ඩබ්ලිව්. අමරසේන ද සිල්වා,
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

2011 සැප්තැම්බර් මස 30 වැනි දින,
අංක 103/25,
පී. ආර්. ද සිල්වා මාවත,
බලපිටිය.
දුරකථන අංක : 0912257482.

10-360

**සම්පත් බැංකුව පීඑල්සී**
**ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී**
**සෙලාන් බැංකුව පීඑල්සී**
**හැටන් නැෂනල් බැංකුව පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ ඉඩමක් සහ විදුලි ව්‍යාපෘතියක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කඩුපිට පත්තුවේ, ලහුපනේ ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන සහ තලම්තිකරු එම්. පී. ජයලත් කුමාර යන අය විසින් සාදන ලද, 2003 ජනවාරි මස 01 දාතම හා අංක 1317 දරන පිඹුරේ නිරූපිත හුණුගලවත්ත ලෙස හැඳින්වෙන ඉඩමේ කොටසක් සහ පෙනවලගාවවත්ත නොහොත් හේන ලෙස හැඳින්වෙන ඉඩම් කොටසේ ඒකාබද්ධයක් වන ලොට් අංක 16 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම නිදහස් හා රිසි අයිතීන් ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 02, පර්. 17

එහි පිහිටි සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් සහිතව.

ඉහත කී ලහුපනේ ග්‍රාමයේ පිහිටි හුණුගලවත්ත ලෙස හැඳින්වෙන ඉඩමේ කොටසක් සහ පෙනවලගාවවත්ත නොහොත් හේන ලෙස හැඳින්වෙන ඉඩමේ අංක 1317 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 9 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම නිදහස් හා රිසි අයිතීන් ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 03, පර්. 4.98

එහි පිහිටි සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් සහිතව.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් සහ පරණකුරු කෝරළේ, කදූඅග පත්තුවේ දකුණු කඩුපිට පත්තුව ලහුපනේ සහ හාල්මැස්ස ග්‍රාමයේ පිහිටි හුණුගල එස්ටේට් ලෙස හඳුන්වන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. එල්. ආර්. වීරසිංහ යන අය විසින් සාදන ලද 2004 නොවැම්බර් මස 19 දාතම හා අංක 666 දරන පිඹුරේ ලොට් අංක 1 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම බදුකර අයිතීන් ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 6.73

එහි පිහිටි සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් සහිතව.

ඉහත කී ලහුපන සහ හාල්මැස්ස ග්‍රාමයේ පිහිටි හුණුගල එස්ටේට් ලෙස හඳුන්වන ඉඩමට අංක 666 දරන පිඹුරේ ලොට් අංක 2 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම බදුකර අයිතීන් ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ් 0, පර්. 16.74

එහි පිහිටි සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් සහිතව.

ඉහත කී ලහුපන සහ හාල්මැස්ස ග්‍රාමයේ පිහිටි හුණුගල එස්ටේට් ලෙස හඳුන්වන ඉඩමට අංක 666 දරන පිඹුරේ ලොට් අංක 3 වශයෙන් ලකුණු කොට ඇති ඒ මත සියලුම බදුකර අයිතීන් ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 32.90

එහි පිහිටි සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් සහිතව.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, කඳවහ පත්තුවේ ඇලගල්ල සහ හුණුගල ග්‍රාමසේවක කොට්ඨාසයේ පිහිටි හුණුගල කොට්ඨාසයේ සහ වවුලතැන්න කොට්ඨාසයේ පරම්බේ එස්ටේට් ලෙස හැඳින්වෙන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. ආර්. ටී. කේ. හේරත් විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 12 දාතම හා අංක 2560 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 වශයෙන් ලකුණුකොට ඇති ඒ මත සියලුම උප බදුකර අයිතීන් ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 02, පර්. 7.95 හෙවත් (හෙක්ටයාර් 0.222445)

එකී හුණුගල කොට්ඨාසයේ සහ වවුලතැන්න කොට්ඨාසයේ පරම්බේ එස්ටේට් ලෙස හැඳින්වෙන ඉඩමට අංක 2560 දරන පිඹුරේ ලොට් අංක 02 වශයෙන් ලකුණුකොට ඇති ඒ මත සියලුම උප බඳුකර අයිතීන් ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ් 01, පර්. 29.05 හෙවත් (හෙක්ටයාර් 0.174647)

එකී හුණුගල කොට්ඨාසයේ සහ වවුලතැන්න කොට්ඨාසයේ පරම්බේ එස්ටේට් ලෙස හැඳින්වෙන ඉඩමට අංක 2560 දරන පිඹුරේ ලොට් අංක 3 වශයෙන් ලකුණුකොට ඇති ඒ මත සියලුම උප බඳුකර අයිතීන් ඇති ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ් 01, පර්. 3.00 හෙවත් (හෙක්ටයාර් 0.007588).

පහත සඳහන් දෑ ඇතුළු සියලුම නිශ්චල යන්ත්‍රාගාර යන්ත්‍රෝපකරණ වැද්දුම් සහ සවිකිරීම් :-

| අංක | උපකරණ | සංඛ්‍යාව | පිරිවිතර | වර්ගය | නිෂ්පාදිත රට |
|---|---|---|---|---|---|
| 1 | 36 කේ. වී. හයිවෝල්ටේජ් මීටරින් ඇන්ඩ් ප්‍රොටෙක්ෂන් පැනල් | 1 | 8 BT 1 | Siemens | තුර්කිය |
| 2 | 3 කේ. වී. මීඩියම් වෝල්ටේජ් මීටරින් ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් සින්ක්‍රොනයිසින් පැනල් | 2 | 8 BT 1 | Siemens | තුර්කිය |
| 3 | බැටරි චාජ් | 1 | 24V , 150 AH | Aees | ප්‍රංශය |
| 4 | ට්‍රාන්ස් ෆෝමර් | 2 | 3150 k VA, 3 /33 kV | LTL | ශ්‍රී ලංකාව |
| 5 | ට්‍රාන්ස්ෆෝමර් | 1 | 80 k VA, 0.4/33 k V | LTL | ශ්‍රී ලංකාව |
| 6 | 3k V -ජෙනරේටර් # 1 සෙන්ට්‍රල් කන්ට්‍රෝල් පැනල් | 1 | | | |
| 7 | 3 k V ජෙනරේටර් # 2 සෙන්ට්‍රල් කන්ට්‍රෝල් පැනල් | 1 | | දේශීයව නිෂ්පාදනය කරන ලදී | |
| 8 | 33 k V, HV සෙන්ට්‍රාල් කන්ට්‍රෝල් පැනල් | 1 | | දේශීයව නිෂ්පාදනය කරන ලදී | |
| 9 | ෆ්‍රැන්සිස් ටර්බයින්ස් | 2 | 3000 kW rated for 4.2m3/s @ 66 meters head | Gugler | ඔස්ට්‍රියාව |
| 10 | හයිඩ්‍රොලික් ඒකක | 2 | | | |
| 11 | ලුබ්රිකේෂන් ඔයිල් සිස්ටම් | 2 | | Rockwell | පෝලන්තය |
| 12 | AVR සමග සින්ක්‍රොනස් ජෙනරේටර් | 2 | 3000kVA, 750 rpm, 3kV | Dolmel | පෝලන්තය |
| 13 | බටර්ෆ්ලයි වැල්ව් | 2 | | Gugler | ඔස්ට්‍රියාව |
| 14 | ටර්බයින් කන්ට්‍රෝල් පැනල් | 1 | | Gugler | ඔස්ට්‍රියාව |
| 15 | ලෝ වොල්ටේජ් පැනල් | 1 | 400 V | දේශීයව නිෂ්පාදනය කරන ලදී | |
| 16 | Y - බ්‍රාන්ච් පයිප් | 1 | | | |
| 17 | ගැන්ට්‍රි ක්‍රේන් | 1 | | | |
| 18 | සංඥා රැහැන | 1 | | | |
| 19 | පවර් කේබලය | 1 | | | |
| 20 | අර්තින් | 1 | | | |
| 21 | හදිසි ශල්‍යකර්ම මේසය | 1 | | | |
| 22 | එලාර්ම් උපකරණය | 1 | | | |
| 23 | මීටර් 329 පෙන්ස්ටොක් පෙනිට්‍රේෂන් | 1 | | | |

| | | |
|---|---|---|
| 24 | හයි ටෙන්ෂන් ස්විච් ගියර් | 1 |
| 25 | ප්‍රධාන වැල්ව් එක | 1 |
| 26 | දුරස්ථ පාලකය | 1 |
| 27 | මීඩියම් වෝල්ටේජ් ක්‍යුබිකල් | 1 |
| 28 | ප්‍රධාන ට්‍රාන්ස්ෆෝමරය | 2 |
| 29 | අතිරේක ට්‍රාන්ස්ෆෝමරය | 1 |

මින් මතු සවිකරනු ලැබිය හැකි දැනට පවත්නා ඕනෑම යන්ත්‍රෝපකරණයක් වෙනුවට ස්ථිරව සවිකරනු ලැබිය හැකි සියලුම යන්ත්‍රෝපකරණ සහ මෙහි දෙවැනි උපලේඛනයේ විස්තර කොට ඇති නිශ්චල දේපළෙහි අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සලකනු ලබන සහ මින් මතුවට, ස්ථිරව මෙම ගොඩනැගිල්ලට සවිකරනු ලබන සහ මෙම ලේඛනයේ දැක්වෙන, හා කලින් කලට හා සියලුම කාලයන් හි දී ගෙනෙනු ලබන සියලු යන්ත්‍රෝපකරණ ඇතුළත් විය යුතු යි.

සම්පත් බැංකුව පීඑල්සී, ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී, සෙලාන් බැංකුව පීඑල්සී, හැටන් නැෂනල් බැංකුව පීඑල්සී යන බැංකු වෙත බෝරුක පවර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් උකස් කරනු ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ, අප විසින් 2011 නොවැම්බර් මස 03 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25% ක් (සියයට විසිපහක්),
2. පලාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 213,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
7. ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 2010 මාර්තු මස 12 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2010 මාර්තු මස 01 වැනි දින දිනපතා පුවත්පත් වන දිවයින, ද අයිලන්ඩ්, සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

විකුණුම් පිළිබඳ වැඩි විස්තර සහ කොන්දේසි සඳහා අමතන්න. විධායක - ණය අයකර ගැනීමේ අංශය, සම්පත් බැංකුව පීඑල්සී, අංක 110, සර් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011- 4730230/0114 - 730229.

* ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත්, සියවසකට අධික කලක් ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන අංකය/ෆැක්ස් අංකය : 081-2224371.
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176.
ඊ-මේල් : schokman@samera 1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com.

10-357

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.